යම්කිසි වෘත්තියක් හැඳින්වීමේදී, අපහාසාත්මක ස්වරයකින් දැක්වෙන නිශේධනාත්මක නාමකරණයන් ඇතැම් විට මාධ්‍ය තුළ දක්නට ලැබේ. "ගුරුවරයා" වෙනුවට "ගුරා" ලෙසින් භාවිතා කිරීම ඊට එක් උදාහරණයකි. මෙහිදී කිව යුත්තේ, මෙවැනි පුවත් වල දැක්වෙන ගුරු වෘත්තිකයන් සැකකරුවකු හෝ වරදකරුවකු වීම, එම වෘත්තිය ආශ්‍රය කරගත් නිශේධනාත්මක නාමකරණයක් භාවිතා කිරීමට හේතුවක් නොවිය යුතු බවයි. මන්දයත්, ශිෂ්ට සම්පන්න චින්තනයක් උදෙසා භාෂාවේ ඇති බලපෑම නොසලකා හැරිය නොහැකි බැවිනි.

කෙසේ වෙතත්, මෙහිදී නිරීක්ෂණය කළ හැකි තවත් කාරණයක් වන්නේ, සිරස්තලයන් තුළ් "ගුරා" වැනි නිෂේධනාත්මක පද භාවිතා වුවත්, පුවත් අන්තර්ගතය තුළ අදාළ අයවලුන්ව ගුරුවරයන් ලෙසින් දක්වා තිබීමයි. මීන් පෙරද සිරස්තල යෙදීම පිළිබඳව ප්‍රශ්න කෙරුණු අවස්ථාවන්හිදී එම සාකච්ඡාවන් ඔස්සේ මතු කෙරුණු කාරණයක් වූයේ, බොහෝ විට පුවත් වාර්තාවන් සඳහා සිරස්තල යොදනු ලබන්නේ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොවන බවයි.

මේ සම්බන්ධයෙන් ඔබට ඇති අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima #Dinamina